| දෙවන වාර පරීක්ෂණය - 2011 | | |
|---|---|---|
| මාරිස් ස්ටෙල්ලා විදුහල - මීගමුව | | |
| **6 ශ්‍රේණිය** | පෙරදිග සංගීතය | **කාලය පැය 2 යි** |
| නම :......................................................... | ශ්‍රේණිය :....................... | අංකය :....................... |

- **නිවැරදි පිළිතුර තෝරන්න.**

## I කොටස

1) ශ්‍රී ලංකා ජාතික ගීයේ නිර්මාතෘවරයා වන්නේ,
   I. රවීන්ද්‍රනාත් තාගෝර් තුමාය.
   II. ඩබ්.ඩී අමරදේව මහතාය.
   III. ආනන්ද සමරකෝන් මහතාය.
   IV. සුනිල් ශාන්ත මහතාය.

2) ශ්‍රී ලාංකීය සංගීතඥයෙකු වෙනත් රටක ජාතික ගීයක් නිර්මාණය කරන ලදී. එම රට හා දංගීතඥයා වන්නේ,
   i. ඉන්දියාව- ඩබ්.ඩී අමරදේව මහතා
   ii. මාලදිවයින- ඩබ්.ඩී අමරදේව මහතා.
   iii. ඕස්ට්‍රේලියාව-සුනිල් ශාන්ත මහතා.
   iv. ජපානය- ආනන්ද සමරකෝන් මහතා.

3) පාසල් ගීය ගයන විට,
   i. පහසුවෙන් සිටිය යුතුය.
   ii. නටමින් සිටිය යුතුය
   iii. දණගසා සිටිය යුතුය
   iv. සීරුවෙන් සිටිය යුතුය

4) "රෑන් ඇදිච්චද බලකොයි නෑනෝ" මෙම ගී පදය,
   i. මේවර කෙළයේ එන්නකි.
   ii. ඔළිඳ කෙළියේ එන්නකි
   iii. එළුවන් කෑමේ එන්නකි
   iv. ලී කෙළියේ එන්නකි.

5) කෙළි ගී ගනයට අයත් නොවන්නේ,
   i. කළ ගෙඩි සෙල්ලම් ගීතය.
   ii. එළුවන් කෑම.
   iii. හවරි හැන්ගීමේ ගීතය.
   iv. ගොයම් කැපීමේ ගීතය.

6) තානමකින් ආරම්භකර නර්තනය ප්‍රධාන කොට කෙරෙන ජන ක්‍රීඩාවකි,
   i. කළගෙඩි සෙල්ලම .
   ii. එළුවන් කෑම
   iii. කුළු නැටුම
   iv. මෝල්ගස් නැටුම.

7) ප්‍රකට ළමා ගීතයක් වන්නෙ,
   i. කඳු පේලි අතරේ.
   ii. මිදුලේ වැල්.
   iii. රත්තදීප ජන්මභූමි.
   iv. ඕලු පිපීලා.

8) එංචමයේ සුවර සංඥාව (සුවර සංකේතය) වන්නේ,

i. ස. ii. ම. iii. ග. iv. ප

9) ස්වර පුවරුවේ කලු යතුරු වලින් දැක්වෙන්නේ,

i. කෝමළ ස්වරයි.
ii. තිව්‍ර ස්වරයි.
iii. විකෘති ස්වරයි.
iv. ප්‍රකෘති ස්වරයි.

10) කෝමල ස්වරයක් ලිවීමේදී,

i. ස්වරයට යටින් ඉරක් ගසනු ලබයි
ii. ස්වරයට යටින් තිතක් තබනු ලබයි
iii. ස්වරයට උඩින් ඉරක් ගසනු ලබයි
iv. ස්වරයට උඩින් තිතක් තබනු ලබයි

(ලකුණු 1×10=10

- **පහත පද උපයෝගී කරගෙන හිස්තැන් පුරවන්න.**

**11)** රටක ජාතියක අනන්‍යතාව ..............................තුළින් ධ්වනිත කෙරේ.

**12)** රිෂභය සඳහා ගායනයේදී යොදා ගන්නා අපරදිග ස්වර නාමය නම්.........................වේ

**13)** ..........................ස්වර පුවරු සංගීත භාණ්ඩයකි.

**14)** දෙපිළ බෙදී කරන ජන ක්‍රීඩාවකි ..........................

**15)** ස,නි, ධ, ප, ම, ග , රි, ස යනු ........................

**(එළුවන් කෑම/ ජාතික ගිය/ අවරෝහනයයි/ මෙලෝඩිකාව/ රේ (Re))**

(ලකුණු 2×5=10)

- **සුදුසු පිළිතුර යා කරන්න.**

| | |
|---|---|
| **16)** පංචමයට වඩා පහළ හඬ ඇති ස්වර | ස,රි, ග, ම, ප, ධ ,නි, |
| **17)** La (ලා) | නාද |
| **18)** විහිරි හඬ | මාත්‍රා දෙකේ රිද්ම රටාවකි |
| **19)** ස්වර සප්තකය | ම, ග ,රි, ස |
| **20)** xx/x-/x xx̯/xx̯ xx̯/ | ධ |

(ලකුණු 2×5=10)

- **හරි වැරදි යොදන්න.**

**21)** ජන ගන මන අධි නායක ජය හේ ඉන්දියානු ජාතික ගීයකි. ( )

**22)** කඳු කඳු නැගෙනා යනු කෝමළ ගු, නි යෙදෙන ස්වර ස්ථාපන ගීතයකි. ( )

**23)** වයලීනය ස්වර පුවරු සංගීත භාණ්ඩයකි. ( )

**24)** ළමා ගීතයක භාෂාව සරලය. ( )

**25)** සංගීතයේ මාධ්‍යය නාද හා ස්වරයයි. ( )

(ලකුණු 2×5=10)

11 කොටස

- ප්‍රශ්න 4 කට පිළිතුරු සපයන්න

1) ශුද්ධ ස්වර ස්ථාපන ගීතයක් ගීත ස්වර ප්‍රස්තාර කරන්න.

2) ස්වර පුවරුව ඇඳ ස්වර සප්තකය ලකුණු කරන්න.

3) 1.ඔබ උගත් ළමා ගීතයක් සම්පූර්ණයෙන් ලියන්න
 ii. එහි භාෂාව, තනුව හා ගායනය පිළිබඳව ඔබගේ අදහස ලියන්න.

4) 1.කෙළි ගී පිළිබඳව කෙටියෙන් හැඳින්වීමක් කරන්න.
 ii. කෙළි ගී අතරින් ඔබ සිත්ගත් ක්‍රීඩාව නම් කර එයට අයත් ගීතයක් ලියන්න(පද 4ක් සෑහේ)

5) ''නෙළුම් මලකි මං'' යන මාතෘකාවෙන් පද 4 බැගින් වූ කොටස් දෙකකින් යුක්ත ගීතයක් නිර්මාණය කරන්න

(ලකුණු 4×15=60)